# වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය

# පුරප්පාඩු

ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය කෙරෙන සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## *1. නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (ජීව) - පුරප්පාඩු 01*

***සුදුසුකම්***

**බාහිර :**

**වෘත්තිය සුදුසුකම් :** පළමුවැනි හෝ දෙවන ඉහළ පෙළ සිව් වාර්ෂික විද්‍යාවේදී හෝ කෘෂිකර්ම උපාධිය සමඟ අදාල ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය

**පළපුරුද්ද :**

අ) ආචාර්ය උපාධිය ලබාගැනීමෙන් අනතුරුව වසර අටක් (08) හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර දෙකක් (02) ඇතුළත්ව අවම වශයෙන් වසර දාසයක (16) පර්යේෂණ කටයුතු පිළිබඳ කළමනාකරණ මට්ටමේ සේවා පළපුරුද්ද සමඟ යහපත් සේවා වාර්තාවක් තිබීම.

සහ

ආ) විවිධ ක්ෂේත්‍රයන්හි පර්යේෂණ විද්‍යාඥයින් හට නායකත්වය සහ මඟ පෙන්වීමේ හැකියාව සතුවිය යුතු වේ. මානව සම්පත් සහ අනෙකුත් සම්පත් මනා ලෙස යෙදවීම හා කළමනාකරණ කාර්යක්ෂමතාව අමතර සුදුසුකමක් වනු ඇත.

**වයස, වැටුප් කාණ්ඩය හා වැටුප් පරිමාණ :**

අවුරුදු 35 ට වඩා අඩු නොවිය යුතු අතර අවුරුදු 50 ට වඩා වැඩි නොවිය යුතුය. මෙම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාල නොවේ.
HM 1-3 (රු.86,865 – 2270 x 15 – රු.120,915.00)
ඉහත දක්වා ඇති වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා වෘත්තිය දීමනාව ද ගෙවනු ලැබේ.

**සටහන අනුව :** එමෙන්ම රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 02/2015, 01/2015 සහ 01/2015 (i)

සන්නිවේදන දීමනා, ඉන්ධන දීමනාව සහ ප්‍රවාහන දීමනාව හෝ නිල වාහනය වෙනුවෙන්ද සුදුසුකම් ලබයි.

**රැකියා විස්තරය :** රබර් වගාව සහ රබර් සැකසුම් පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම.

**තේරීමේ ක්‍රමය :** පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## ***2. ගණකාධිකාරී - පුරප්පාඩු 01***

**සුදුසුකම්**

බාහිර : ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී අයතනයේ (ICASL)/කළමනාකරණ ගණකාධිකාරී වරලත් ආයතනයේ (CIMA) /වරලත් සහතික කල ගණකාධිකාරී ආයතනයේ (ACCA) අන්තර් මධ්‍ය මට්ටමේ සුදුසුකම් ලබා තිබීම හෝ කළමනාකරණ/වාණිජ සිව් (04) වසරක උපාධිය

සහ

සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පුද්ගලික සමාගමක ගිණුම්කරණය/විගණනය සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්ද ලබාතිබීම

සටහන : පරිගණක ගිණුම් ක්‍රම පිළිබඳ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ.

**වයස, වැටුප් කාණ්ඩය හා වැටුප් පරිමාණය :**

අවුරුදු 22 ට වඩා අඩු නොවිය යුතු අතර අවුරුදු 45 ට වඩා වැඩි නොවිය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් හට මෙම වයස් සීමාව අදාල නොවේ.
MM 1 -2 (රු.54,550 – 1375 x 10 – 1910 x 15 – රු.96,950)
ඉහත දක්වා ඇති වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා වෘත්තීය දිමනාව ගෙවනු ලැබේ.

**රැකියා විස්තරය :** ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරීගේ උපදෙස් මත ආයතනයේ සියළුම මුල්‍ය කටයුතු අධික්ෂණය හා කළමනාකරණය කිරිම.

**තේරීමේ ක්‍රමය:** පත්වීම් බලධරයා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## ***3. පර්යේෂණ නිලධාරී - පුරප්පාඩු 05***

| <u>**පර්යේෂණ අංශ**</u> | <u>**විෂයය පථය**</u> |
|---|---|
| 1. ශාක ව්‍යාධි විද්‍යා හා ක්ෂුද්‍රජීව විද්‍යා දෙපාර්තමේන්තුව | - ශාක ව්‍යාධි විද්‍යාව/ක්ෂුද්‍රජීව විද්‍යාව/කීට විද්‍යාව |
| 2. ප්‍රවේණි හා ශාක අභිජනන දෙපාර්තමේන්තුව | - සම්මත අභිජනනය |
| 3. දළ රබර් සැකසුම් සංවර්ධන හා රසායනික ඉංජිනේරු දෙපාර්තමේන්තුව | - රසායන විද්‍යාව/රසායනික ඉංජිනේරු |
| 4. රබර් තාක්ෂණික හා සංවර්ධන දෙපාර්තමේන්තුව | - රසායන විද්‍යාව/බහුඅවයවික විද්‍යාව (රබර් තාක්ෂණය කෙරෙහි විශේෂ මනාපය යොමු කරනු ඇත.) |
| 5. දළ රබර් හා රසායනික විශ්ලේෂණ දෙපාර්තමේන්තුව | - රසායන විද්‍යාව/විශ්ලේෂණ රසායනය |

**සුදුසුකම්**

බාහිර : අදාල විෂය සංකලනය සහිත පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පළමුවැනි පෙළ හෝ දෙවැනි පෙළ (ඉහළ) සිව් වාර්ෂික (04) විද්‍යාවේදි හෝ කෘෂිකර්ම විශේෂ උපාධිය

හෝ

අදාල විෂය සංකලනය සහිත පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් දෙවැනි පෙළ (පහළ) සිව් වාර්ෂික (04) විද්‍යාවේදී හෝ කෘෂිකර්ම විශේෂ උපාධිය සමඟ අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ එක් අවුරුදු පශ්චාත් උපාධිය

හෝ

අදාල විෂය සංකලනය සහිත විද්‍යාවේදී හෝ කෘෂිකර්ම විශේෂ උපාධිය සමඟ අදාල ක්ෂේත්‍රයේ අවුරුදු දෙකක (02) පශ්චාත් පර්යේෂණ උපාධිය

**වයස, වැටුප් කාණ්ඩය හා වැටුප් පරිමාණය :**

අවුරුදු 22 ට වඩා අඩු නොවිය යුතු අතර අවුරුදු 45 ට වඩා වැඩි නොවිය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් හට මෙම වයස් සීමාව අදාල නොවේ.
AR -1 (රු.53,150 – 1375 x 10 – 1910 x 15 –රු. 95,550)
ඉහත දක්වා ඇති වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා වෘත්තීය දිමනාව ගෙවනු ලැබේ.

**රැකියා විස්තරය :** ප්‍රධාන පර්යේෂණ නිලධාරි, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි හෝ දෙපාර්තමේන්තු ප්‍රධානිගේ අධීක්ෂණය යටතේ, පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම, ප්‍රථිඵල විශ්ලේෂණය කිරිම සහ විශේෂිත විෂයන්හි දත්ත ඉදිරිපත් කිරිම සහ දත්ත රැස්කිරීම සහ වාර්තා කිරිම සඳහා අත්හදාබැලීමේ සහ කාර්මික නිලධාරීන්ට මඟ පෙන්විම මෙන්ම පර්යේෂණ ව්‍යාපෘති හඳුනාගැනිම සහ සැලසුම් කිරීමේදි ප්‍රධාන පර්යේෂණ නිලධාරින් සහ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරින් හට සහාය විම.

**තේරිමේ ක්‍රමය :** ලිඛිත තරඟ විභාගයේ (අභියෝගතා පරීක්ෂණය) ප්‍රථිඵල මත පත්විම් බලධරයා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## *4. රබර් ව්‍යාප්ති නිලධාරි - පුරප්පාඩු 05*

**සුදුසුකම්**

**බාහිර :** පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් විද්‍යා/කාෂිකර්ම/වැවිලි කළමනාකරණ උපාධිය.

**වයස, වැටුප් කාණ්ඩය හා වැටුප් පරිමාණය :**

අවුරුදු 22 ට වඩා අඩු නොවිය යුතු අතර අවුරුදු 45 ට වඩා වැඩි නොවිය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් හට මෙම වයස් සීමාව අදාල නොවේ.
MA - 4 (රු.37,970 – 755 x 10 – 930 x 15 - 1135 x 5 – රු.65,145)
ඉහත දක්වා ඇති වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

**රැකියා විස්තරය :** රබර් ක්ෂේත්‍රයට අදාල සියළුම ව්‍යාප්ති/උපදේශන කටයුතු සඳහා සහායවිම සහ ප්‍රධාන උපදේශක නිලධාරි/ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරී/උපදේශක නිලධාරී යටතේ අදාල කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන සේවාවන් සම්බන්ධීකරණය කිරිම.

**තේරිමේ ක්‍රමය :** ලිඛිත තරඟ විභාගයේ ප්‍රථිඵල මත (භාෂා නිපුනත්වය/ අභියෝගතා පරීක්ෂණය හා තනතුරට අදාල විෂය දැනුම) හා පත්විම් බලධරයා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**සියළු තනතුරු සඳහා වෙනත් වරප්‍රසාද සහ පොදු කොන්දේසි**

- ආයතනයේ වෛද්‍යාධාර යෝජනා ක්‍රමයේ පවතින නීති රීති ප්‍රකාර වෛද්‍ය ප්‍රතිලාභ ලබා දෙනු ලැබේ.
- සේවකයා විසින් වැටුපෙන් 10% ක් කාර්යය මණ්ඩල අර්ථ සාධක අරමුදල සඳහා දායක කළ යුතු අතර,

  ආයතනය විසින් 15% ක දායකත්වයක් සපයනු ලැබේ. සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල වෙනුවෙන් ආයතනය විසින් 3% ක දායකත්වයක් සපයනු ලැබේ.
- අගලවත්ත කාර්යාලයේ සේවය සඳහා තේරී පත්වන අය සඳහා (ආයතනයේ නීති රීති ප්‍රකාරව හිස්ව තිබේ නම්, කුලී රහිත, ගෘහ භාන්ඩ සහිත නිල නිවාසයක් ලබාගැනීමට හෝ රත්මලාන සිට අගලවත්ත දක්වා ධාවනය කෙරෙන කාර්යාල බස් රථයෙන් (ආයතන) නීති රීති ප්‍රකාරව දිනපතා ගමන් කිරීමේ පහසුකම් ලබා ගත හැක.
- ශ්‍රී ලංකාවේ ඕනෑම පලාතකට මාරු කළ හැක.

**අයදුම්පත් ක්‍රියාවලිය**

පහත දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුව සකසන ලද අයදුම්පත් **2023.07.04 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ** ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කළ යුතුය. ලිපි කවරයේ ඉහල වම් කෙළවරෙහි තනතුර සඳහන් කළ යුතු වන අතර, දැනට රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/පුද්ගලික ආයතන වල සේවය කරන අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත අදාල ප්‍රධානින් මගින් ඉදිරිපත් කළ යුතුය.

**පර්යේෂණ නිලධාරී තනතුර සඳහා ඉල්ලුම් කිරීමේදි වෙබ් අඩවියේ සඳහන් පරිදි අදාල පර්යේෂණ අංශය සහ විෂයය පථය සඳහන් කළ යුතුය. තනතුරු කිහිපයකට අයදුම්පත් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් එක් එක් පර්යේෂණ අංශ සඳහා විෂයය පථය සඳහන් කරමින් වෙන වෙනම අයදුම්පත් යොමු කළ යුතුය.**

1. සම්පූර්ණ නම, වයස සහ විවාහක අවිවාහක බව
2. අදාල අධ්‍යාපන සහතික සහ උප්පැන්න සහතිකය ඇතුළු වෙනත් සහතික වල සහතික කරන ලද පිටපත් ඇමිණිම අනිවාර්යය වේ.
3. වර්තමාන සහ පසුගිය රැකියාවන් හි රැකියා යෝජකයන්ගේ නම, ලිපිනය සහ රැකියාව වෙනස් කිරිමට හේතු
4. අයදුම්කරුගේ කුසලතාවයන් සහ දැනුම ඇගයීමට හැකි ඥාතීන් නොවන නිර්දේශකවරුන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්

ඉහත අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරිමට හේතු වේ. කුමන ආකාරයකින් හෝ මේ සම්බන්ධයෙන් අනිසි බලපෑම් කිරීමද නුසුදුසුකමක් වනු ඇත.

අධ්‍යක්ෂ (වැ.බ.)
ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය
ඩාර්ටන්ෆීල්ඩ්
අගලවත්ත.

2023.06.07